සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 07 - 2023

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

කාලය:
පැය 01 විනාඩි 30

නම / විභාග අංකය:

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01. වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටසක් වනුයේ කුමක්ද?
   i. යතුරු පුවරුව  ii. මව් පුවරුව  iii. මතක රෙජිස්තර  iv. පද්ධති ඒකකය

2. දෙවන පරම්පරාවේ පරිගණක වල භාවිතා වූ ඉලෙක්ට්‍රොනික තාක්ෂණය වන්නේ,
   i. අනුකලිත පරිපථ  ii. රික්තක නල  iii. ට්‍රාන්සිස්ටර  iv. ක්ෂුද්‍ර පරිපථ

3. ………………… යනු ජංගම දුරකථන වල භාවිත වන මෙහෙයුම් පද්ධතියකි.
   i. මැක් OS  ii. ඇන්ඩ්‍රොයිඩ්  iii. ෆෙඩෝරා  iv. වින්ඩෝස්

4. හදිසි අවස්ථාවකදී දත්ත නැති වූ විට නැවත ලබා ගැනීම සඳහා ළඟ තබා ගත හැකි පිටපත කුමක්ද?
   i. දෘඩ පිටපත  ii. මෘදු පිටපත  iii. උපස්ථ පිටපත  iv. දත්ත පිටපත

5. ගොනුවක් සතු ගුණාංගයන් අතරට අයත් <u>නොවන</u> පිළිතුර තෝරන්න.
   i. ගොනුවේ වර්ගය  ii. ගොනුවේ ප්‍රමාණය  iii. ගොනුවේ දිගුව  iv. ගොනුවේ හැඩය

(2 x 5 = 10)

02. "අ" කොටසට ගැළපෙන පිළිතුර "ආ" කොටසින් තෝරා යා කරන්න.

| "අ" කොටස | "ආ" කොටස |
|---|---|
| 1. චුම්බක මාධ්‍ය ආචයන උපාංගයකි. | ට්‍රෝජන් අශ්වයා |
| 2. විද්‍යුත් සමර්පණ නිර්මාණයට භාවිත මෘදුකාංගයකි. | වෙබ් කැමරාව |
| 3. අනිෂ්ට මෘදුකාංග වර්ගයකි. | MS Power Point |
| 4. මාර්ගගත වීඩියෝ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට අත්‍යවශ්‍ය උපාංගයකි. | QWERTY |
| 5. වර්තමානයේ භාවිතා කරන යතුරු පුවරුව මේ නමින් හඳුන්වයි. | දෘඩ තැටිය |

(2 x 5 = 10)

03. වඩාත් ම ගැළපෙන පිළිතුර දී ඇති පද ලැයිස්තුවෙන් තෝරා ලියන්න
(පද ලැයිස්තුව - ගොනු බහාලුම / හර්ට්ස් / Spam / වෙබ් පිටු / Bugs)

1. අනවශ්‍ය ලෙස වර්ග කරන විද්‍යුත් තැපැල් ලිපි …………………… තුළ තැන්පත් වේ.
2. ක්‍රමලේඛයක ඇති දෝෂ …………………… ලෙස හඳුන්වයි.
3. පරිගණකයේ ගොනු කිහිපයක් …………………… තුළ තැන්පත් කළ හැකිය.
4. HTML භාවිතයෙන් …………………… නිර්මාණය කර ගත හැකිය.
5. මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මැනීම සඳහා …………………… ඒකකය භාවිතා කරනු ලබයි.

(2 x 5 = 10)

04. පහත ප්‍රකාශ හරි නම් ( √ ) ලකුණු ද වැරදි නම් ( x ) ලකුණ ද යොදන්න.

1. ඇල්ගෝරිතමයක පියවරකට පසු පියවරක් ලෙස ක්‍රියාත්මක වීම අනුක්‍රමය ලෙස හඳුන්වයි. (……)
2. විද්‍යුත් තැපැල යනු අන්තර්ජාලයෙන් ලැබෙන සේවාවක් නොවේ. (……)
3. ගොනුවක් ගොනු නාමය හා මෘදුකාංගය ලෙස කොටස් දෙකකි. (……)
4. මව් පුවරුව යනු බාහිරින් දැකිය හැකි පරිගණක දෘඩාංගයක් නොවේ. (……)
5. පරිගණක වර්මිස් යනු මිනිසාගේ කාර්යයන් පහසු කරන වැදගත් මෘදුකාංගයකි. (……)

(2 x 5 = 10)

05. (i) ඇල්ගොරිතම තුළ භාවිත වන මූලික පාලන ව්‍යුහ මොනවාද?


……………………………………………………………………………………


……………………………………………………………………………………

……………………………………………………………………………………

(2 x 3 = 6)

(ii) පහත ගැලීම් සටහන අධ්‍යයනය කර Scratch ක්‍රමලේඛය සකස් විය යුතු අනුපිළිවෙලට 1-7 දක්වා අංක යොදන්න.




(2 x 7 = 14)

06. (i) වදන් සැකසීම සඳහා භාවිත කළ හැකි මෘදුකාංග දෙකක් නම් කරන්න.

a. ............................................ b. ............................................

(ii) වදන් සැකසීමේ මෘදුකාංග මගින් ඉටුකරගත හැකි කාර්යයන් තුනක් නම් කරන්න.

a. ........................................................................................................

b. ........................................................................................................

c. ........................................................................................................

(iii) වදන් සැකසීමේ මෘදුකාංගයක් මගින් පහත කාර්යයන් සිදු කර ගැනීම සඳහා භාවිත කරන යතුර වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

a. වචනයක පළමු අකුර කැපිටල් අකුරක් ලෙස යතුරු ලියනය කිරීම.
(Tab / Space Key / Shift Key)

b. SCHOOL ලෙස වචනයේ අකුරු, කැපිටල් අකුරු ලෙස යතුරු ලියනය කිරීමට.
(Enter / Caps Lock / Backspace)

c. I am Nimal ලෙස යතුරු ලියනය කර මීළඟ පේළිය යතුරු ලියනය කිරීමට කර්සරය පහළට ගැනීමට.
(Caps Lock / Shift / Enter)

d. My Selff ලෙස යතුරු ලියනය වූ විට වැරදීමකින් යතුරු ලියනය වූ " **f** " අකුර මැකීම සඳහා.
(Enter / Shift / Backspace)

e. MySchool ලෙස වැරදියට යතුරු ලියනය වූ විට එය නිවැරදි කිරීමට වචන දෙක අතර ඉඩක් තැබීමට.
(Space Bar / Enter / Shift)

(2 x 10 = 20)

07. කෙටි පිළිතුරු ලියන්න.

(i) අන්තර්ජාලයට සම්බන්ධ වීම සඳහා අවශ්‍ය පහසුකම් තුනක් ලියන්න.

a. ………………………………………………………………

b. ………………………………………………………………

c. ………………………………………………………………

(ii) විශ්වසනීය වෙබ් අඩවියක් වෙන් කර හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි ක්‍රමයක් සඳහන් කරන්න.

………………………………………………………………………………………………

………………………………………………………………………………………………

(iii) වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා භාවිත කළ හැකි මෘදුකාංගයක් නම් කරන්න.

………………………………………………………………………………………………

(iv) විද්‍යුත් තැපැල (E-mail) හරහා හුවමාරු කළ හැකි දේවල් සඳහා උදාහරණ තුනක් ලියා දක්වන්න.

a. ………………………………………………………………

b. ………………………………………………………………

c. ………………………………………………………………

(v)

| |
|---|
| **sadaru56@gmail.com** |

ඉහත විද්‍යුත් තැපැල් ලිපිනයෙහි පරිශීලක නාමය හා වසම් නාමය ලියා දක්වන්න.

a. පරිශීලක නාමය :-. ………………………………………………………………

b. වසම් නාමය :-. ………………………………………………………………

(2 x 10 = 20)